**කඩුවෙල මහා නගර සභාව - 2021**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

**කඩුවෙල මහා නගර සභාවේ** 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කඩුවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2017 හි ප්‍රමිත අංක 11.10 අනුව පානීය ජලය ලබා ගැනීමේදී මාර්ගවලට හානි සිදුකිරීම වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල්වලට අදාළව අසම්භාව්‍ය වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | අසම්භාව්‍ය වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මංමාවත් බෝක්කු හා පාලම් වටිනාකම තුළ රු.740,627ක් වටිනා ගොඩනැගිලි ඇතුළත්කර තිබුණි. | ඉදිරියේ දී පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ගොඩනැගිලි වටිනාකම ගොඩනැගිලි ගිණුමට නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර ක්ෂය වටිනාකම රු.1,391,530 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.2,089,221 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.697,691 ක් අඩුවෙන් හා පරිපාලන වියදම් රු.697,691 ක් වැඩියෙන් දක්වා තිබුණි. | **විගණනයේ කරුණු හා එකඟ නොවේ.**<br><br>රු.216,800 වනුයේ 2020 වර්ෂයට අදාළ යන්ත්‍රෝපකරණ ආරම්භක ශේෂ වටිනාකම මත ගණනය කළ වාර්ෂික ක්ෂය වටිනාකමය. එය අඩුකර නොව එකතු වූ වටිනාකමයි.<br>(4,336,000 x 5% - 216,800)<br>2021 ජනවාරි 01 දිනට යන්ත්‍ර වටිනාකම රු.28,047,396.70 කි. | යන්ත්‍ර ක්ෂය වටිනාකම ගණනය කිරීමේදි එය නිවැරදිව කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර ක්ෂය වටිනාකම ගිණුම් පිළියෙළ කිරීම සඳහා භාවිතා කර ගිණුම්කරණ ප්‍රමිත අනුව,නිවැරදිව ගණනය කර තිබේ. ඒ අනුව 2021.12.31 අවසන් වර්ෂය සඳහා යන්ත්‍ර මත ක්ෂය වටිනාකම රු.2,089,221 කි. | |
| (ඇ) | හුවමාරු ගනුදෙනුවලින් වන අයභාරය රු.2,925,571 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගණනය කොට ගිණුම් ගතකළ යුතුවේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දිගුකාලීන ණයවල ජංගම කොටසෙහි දේශීය ණය සංවර්ධන අරමුදල වෙනුවෙන් ශේෂය රු.5,450,303 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයේ එය රු.4,158,730 ක් ලෙස දැක්වීම හේතුවෙන් කෙටිකාලීන ගෙවිය යුතු දෑ රු.1,291,573 ක් අඩුවෙන් ද දිගු කාලීන ණය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වේ.<br><br>ගණනය කිරීමේදී සිදු වූ අතපසු වීම් නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. | දිගුකාලීන ණයවල ජංගම කොටස කෙටිකාලීන ගෙවිය යුතු දෑ ලෙස සටහන් කළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විට ඉදිකිරීම් නිමකර තිබූ පිරිවැය රු.21,532,320ක් වූ ගොඩනැගිලි 2 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් වනවිටත් නොනිමි ගොඩනැගිලි ලෙස තිබීමෙන් එම ප්‍රමාණයෙන් ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | **එකඟ වේ.**<br>මෙම කරුණ යටතේ දක්වා තිබූ හෙළ බොජුන් හල - කඩුවෙල සහ කඩුවෙල පුස්තකාලය ඉදිරිපිට ගොඩනැඟිල්ල යන ස්ථාන සම්බන්ධයෙන් ඒවායේ 2021.12.31 දිනට තත්ත්වය සහ එහි පිරිවැය අගයන් දක්වා තොරතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා නාගරික ඉංජිනේරු වෙත ලිපියක් මඟින් දන්වා ඇත. ඒ පිළිතුරු ලිපිය අනුව ඉදිරියේදී ගිණුම් තැබීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වැඩ නිමකර ඇති ගොඩනැගිලි පිරිවැය වටිනාකම් ගොඩනැගිලි වටිනාකමට ගිණුම් ගතකළ යුතුවේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂ අවසානයට ගෙවිය යුතු විවිධ ණයහිමියන් ලෙස වෙන්කර තිබුණු රු.2,575,900 ක ප්‍රාග්ධන වැය වර්ග 2ක් පුනරාවර්තන වැය ලෙස ගිණුම්ගත කර තිබුණි. | **ජීවවායු ජෙනරේටරය සම්බන්ධ දෝෂය හා** අඟල් 19 LED මොනිටර් 3 සම්බන්ධ වන දෝෂය හා එකඟ වේ.<br><br>ඒ අනුව මෙම දෝෂයන් ජර්නල් අංක 7 හා 8 මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ප්‍රාග්ධන වැය නිවැරදිව ප්‍රාග්ධනිත කොට ගිණුම් ගතකළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (උ) | ගබඩා ලෙජරය අනුව තොග අගය රු.596,456ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | ඉදිරියේ දී පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ගබඩා තොග ශේෂය නිවැරදිව ගිණුම් ගතකළ යුතුවේ. |
| (ඌ) | රු.5,684,705ක් වටිනා දේපළ, පිරියත හා උපකරණ අයිතම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාවේ තොගයෙහි පැවතීම හේතුවෙන් දේපළ පිරියත හා උපකරණ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේ දී පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | දේපළ පිරියත හා උපකරණ ශේෂය නිවැරදිව ගිණුම් ගතකළ යුතුවේ. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විෂයයන් 5කට අදාල සමාලෝචිත වර්ෂ අවසානයේ මුල්‍ය ප්‍රකාශනවල පැවති ශේෂයන් සහ උපලේඛනවල පැවති ශේෂයන් අතර රු.20,116,544ක නොසැසදීම් නිරීක්ෂණය විය. | • ප්‍රවර්තන වර්ෂය තුළ එම අයභාර ප්‍රාග්ධනිත කර ස්ථාවර තැන්පතු යටතේ ජර්නල් සටහන මඟින් නිවැරදිව ගිණුම්ගත කෙරේ.<br>• ඉදිරියේ දී පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.<br>• දෝෂයන් 2022 ජර්නල් අංක 03 සහ 05 මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.<br>• සේවක ණය විෂය මඟින් අවසන් ගිණුම වෙත ලබාදුන් උපලේඛණය සහ 2021.12.31 දිනට සේවක ණය ගිණුමේ ශේෂය අතර වෙනසක් නොපවතින බව දන්වා සිටිමි.<br>• වරද නිවැරදි කිරීම 2022 ජර්නල් අංක 09 මඟින් සිදු කරන ලදී. බත්තරමුල්ල දිස්ත්‍රික් කාර්යාලය වෙනස ඇති වීමට හේතුව විමසා ඇති අතර එම කරුණු අනුව නිවැරදි කිරීම් ඉදිරියේදී සිදු කරනු ලබන බව දන්වා සිටිමි. | වර්ෂ අවසානයේ මුල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ උපලේඛන අනුව ශේෂය සමාන විය යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත<br>252 අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 136 ආ (1) | අංක 2/243 ඉඩමෙහි පිහිටි අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා පැමිණිලි 05ක් ඉදිරිපත් කර තිබුණද, එම අනතුරුදායක ගස් ඉවත්කර නොතිබුණි. | 2022. 06. 02 දින කඩුවෙල මහා නගර සභාවේ නගරාධිපතිතුමා සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර, එහිදී එකඟ වූ පරිදි 2022. 06. 28 දිනට පෙර මෙම ප්‍රශ්ණගත ඉඩමේ පවතින සියලු ම අනතුරුදායක ගස් ඉවත් කිරීමටත් අදාළ පාර්ශවය දැනුවත් කර ඇත. 2022. 06. 28 දිනට අතර, කාලය තුළ යාබද ඉඩම් හිමියන්ගේ ජීවිත, දේපල හා කිසියම් දෙයකට යම් ආකාරයෙන් හානියක් සිදුවුව හොත් එකී වගකීම ඉඩමේ අයිතිකරු විසින් දැරිය යුතු බවට නියෝග කරන ලදි. | මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | | |
| (i) | --<br>මුදල් රෙගුලාසි 371 (5) | නිකුත් කරන ලද අත්තිකාරම් නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවිය යුතු වුවද දිගින් දිගටම පැවත එන නොපියවූ අත්තිකාරම් ශේෂය පියවීමට කටයුතු කර නොතිබුණි. | එම හඳුනානොගත් නොපියවූ අත්තිකාරම් මුදලින් හඳුනාගන්නා ලද අත්තිකාරම් සඳහා අදාළ ජ්නල් සටහන් යොදා නිවැරදි කිරීම් කළ අතර, ඉතිරි ශේෂය | මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුවේ |

| | | | | |
|---|---|---|---|---|
| | | | වූ රු. 193,544 ක මුදල මෙතෙක් හඳුනා ගැනීමට නොහැකි වී ඇත. එම ශේෂය ඉදිරියේ දී හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ii) | මුදල් රෙගුලාසි 396 | බැංකු සැසඳුම් ප්‍රකාශනයට අනුව මාස 06 ඉක්මවූ නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු.233,661 ක චෙක්පත් 36ක් තිබූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශනයට අනුව මාස 06 ඉක්මවූ නිකුත් කළ නමුත්, ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු.233,661 ක් වටිනා චෙක්පත් 36 ක් තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (iii) | මුදල් රෙගුලාසි 396 | බැංකු සැසඳුම් ප්‍රකාශනයට අනුව මාස 06 ඉක්ම වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 06ක් නිරීක්ෂණය වූ අතර එම චෙක්පත් සම්බන්ධයෙන් දෛනික ලැබීම් වාර්තා වෙනස්කම් සම්බන්ධව සොයා බලා අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | චෙක්පත් අංක 676355 හා 288943 යන චෙක්පත් සීගාස් මෘදුකාංගයේ දෝෂයක් මත දෙවරක් එම වටිනාකම් ආදායම් ගත වී ඇති බවට බත්තරමුල්ල දිස්ත්‍රික් කාර්යාලය මඟින් දැනුවත් කර ඇත. ඉදිරියේදී එම වරද නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව අනිකුත් උපලබ්ධි නොවූ වටිනාකම් පිළිබඳව ප්‍රධාන කාර්යාලය, කඩුවෙල, බත්තරමුල්ල ,අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාලයන් විටින් විට දැනුවත් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉදිරි බැංකු සැසඳුම් තුළින් නිවැරදි කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1(ආ) ඡේදය | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000/- ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දිය යුතු වුවද එම සීමාව ඉක්මවා රු.1,640,939 ක් අවස්ථා 07 කදී ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. | සභාවේ අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් ඉහත සඳහන් අනුමැතිය යටතේ රු.100,000 ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී ඇති බව දන්වමි | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.622,069,391 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.294,584,222 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

-----------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මහජන බැංකුවේ ගිණුම් අංක 196 – 1-001-6-3869561 දරන ජංගම ගිණුම දීර්ඝ කාලයක සිට අක්‍රියව පැවති අතර එම ගිණුමේ පවතින රු.14,124ක ශේෂයක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනා නොගත් ගෙවීම් වටිනාකම වූ රු.14,124ක මුදල ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි | දීර්ඝ කාලයක සිට අක්‍රියව පවතින ශේෂයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**2.3** **ආදායම් පරිපාලනය**

----------------------

**2.3.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------

(අ) වරිපනම් හා බදු

------------------

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | වරිපනම් බදු | | |
| | සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.80,204,165 ක් වූ අතර ඉන් අවුරුදු 03 ත් 10 ත් අතර කාලයක | ඉදිරියේ දී පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | හිඟ වටිනාකම් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| සිට අයවිය යුතු රු.16,478,833 ක් හිඟ ශේෂයක්ද අවුරුදු 10ට වඩා පැරණි රු.3,193,208 ක හිඟ ශේෂයක්ද වන අතර එය 2022 අප්‍රේල් 08 වන විගණිත දින තෙක් අයකර ගෙන නොතිබුණි. | | |
| (ii) විනෝද බදු<br>-------------<br>සමාලෝචිත වර්ෂය අවසන් දිනට අයවිය යුතුව පවතින විනෝද බදු වටිනාකම රු.7,009,015 ක් වූ අතර එම ශේෂය තුළ අවුරුදු 3 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පවතින රු.3,191,249 ක් ද ඇතුළත්ව තිබුණි. | ඉදිරියේ දී පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | හිඟ විනෝද බදු කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (iii) සතිපොළ බදු<br>---------------<br>සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු සතිපොළ ගාස්තු රු.368,126 ක් වූ අතර එම ශේෂය වර්ෂ 05කට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි. | කඩුවෙල සතිපොල හිඟ මුදල් රු. 368,126ක් ලෙස සඳහන් කර ඇති මුදල් 2012 වර්ෂයේ සිට පවතින හිඟයකි. මෙම හිඟ මුදල සම්බන්ධව ගිණුම් කාරක සභාවේ නිර්දේශය මත පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණයක් සිදු කර ඇත. එහි වාර්තාව මා වෙත ලද පසු පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් මත අවශ්‍ය කටයුතු කරමි. | අයවිය යුතු සතිපොළ බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ |

(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | සභාවේ අදහස් දැක්වීම<br>---------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.3,000,000ක් හා මුද්දර ගාස්තු රු.699,939,000ක් විය. 2020 සහ 2021 වර්ෂයන්හිදී ඇස්තමේන්තුගත මුද්දර ගාස්තු ආදායම රු.700,000,000ක් බැගින් වුවත් එම වර්ෂයන්හිදී ලැබී තිබුණේ පිළිවෙලින් රු.2,888,420ක් සහ රු.61,000ක් පමණි. එසේම 2020 සහ 2021 වර්ෂයන්හිදී ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.3,000,000ක් බැගින් ඇස්තමේන්තු කර තිබූ නමුත් 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය අවසානය දක්වාම උසාවි දඩ ආදායම් ලැබී නොතිබුණි. එසේම මෙම උසාවි දඩ සහ මුද්දර ගාස්තු ආදායම් ලබා ගැනීම සඳහා අදාළ ආයතනවලට උපලේඛන ඉදිරිපත් කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. | මුද්දර ගාස්තු ආදායම ප්‍රවර්ථන වර්ෂය තුළ නොලැබෙන අතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් එවා පිටපත් කර ගැනීමට අවසර දෙන්නේ ඊලග වර්ෂයේ දි ය.<br><br>කෙසේ වෙතත් මේ වන විට පහත පරිදි මුද්දර ආදායම් පිටපත් කිරීමට කටයුතු සිදු කරන ලද බව වැඩිදුරටත් දන්වමි.<br><br>උසාවි දඩ ආදායම ලබා ගැනිමට උපලේඛන ඉදිරිපත් කිරීමට ප්‍රමාද වී ඇත්තේ උසාවි නිලධාරීන් හා පැවති අනවබෝධය මත පැන නැගි තිබූ ගැටළු හේතුවෙනි. වර්ථමානයෙහි එම ගැටළු නිරාකරණය කරගෙන 2018 වසරේ සිට දඩ මුදල් පිළිබඳ තොරතුරු පිටපත් කිරීමේ කටයුතු කරමින් පවතී. | උසාවි දඩ සහ මුද්දර ගාස්තු ආදායම් හිඟ නොමැතිව සභාවට ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහජන පැමිණිලි<br>2021 වර්ෂයේදී අනතුරුදායක ගස් සම්බන්ධ පැමිණිලි, පොදු පැමිණිලි අනවසර ඉදිකිරීම් සම්බන්ධ පැමිණිලි හා විදුලි පැමිණිලි වශයෙන් ලැබී තිබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 603ක් වූ අතර එයින් නොවිසඳු පැමිණිලි 312 ක් වීමෙන් ප්‍රදේශවාසී ජනතාවගේ පැමිණිලි සඳහා ප්‍රතිචාර දැක්වීම දුර්වල මට්ටමක පැවතුණ බව නිරීක්ෂණය විය. | පසුගිය වසරේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ නිසි පරිදි දෛනිකව රාජකාරිය ඉටුකිරීමට නොහැකි විය.<br><br>පාරිභෝගිකයන්ගේද සහය ඇතිව වර්තමානයේදී ඉතිරිව ඇති පැමිණිලි අවශ්‍යතාවය මත ඉටුකර දීමට කටයුතු කරමි | ප්‍රදේශවාසී ජනතාවගේ පැමිණිලි සඳහා ප්‍රතිචාර දැක්වීම සභාව සතු නීත්‍යානුකූල වගකීමක් ලෙස ඉටු කළ යුතුවේ. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා බලප්‍රදේශයේ මාර්ගවල කාපට් ඇතිරීම සඳහා 2017 ඔක්තෝබර් 20 වන දින රු.66,612,046 ක වියදමක් දරා මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර ඒකක 6 න් රු.53,351,000 ක් වටිනා යන්ත්‍ර 04 ක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අතුරුගිරිය උපකාර්යාල පරිශ්‍රයේ නිශ්ක්‍රීයව රඳවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | සභාව සතු වත්කම් ඵලදායි කටයුතු වල යෙදවිය යුතුවේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්ත | | මෙම පුරප්පාඩු පිරවීමට සභාව කටයුතු කල යුතුවේ . |
| (i) | සභාවේ ඉහල කළමනාකරණය සඳහා මාණ්ඩලික නිලධාරීන් 8 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර ආදායම් පරීක්ෂකවරුන් 12 දෙනෙකු අනුමත කර තිබුණද ඉන් 9 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩුව පැවතුණි. | මණ්ඩලික නිලධාරී පුරප්පාඩු පුරවනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිසන් සභාව මගිනි. මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් මාසික වාර්තා මගින් හා කාර්තු වාර්තා මගින් ආදාල ආයතන දැනුවත් කරනු ලබයි.<br>එමෙන්ම 2020.02.21 දිනැති කළමනාකරණසේවා චක්‍රලේඛ අංක | |

| | | | |
|---|---|---|---|
| | | 01/2020 මගින් ප්‍රාථමික සේවා ගණයේ ආයතන ගත පත්වීම් සඳහා බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් මෙම පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත.<br>ආදායම් පරීක්ෂකවරුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් පවතින බැවින් පාලාත් පාලන කොමසාරිස්ගේ LGD/02/21/5/5 වෙළුම හා 2016.05.12 දිනැති ලිපිය මගින් නැවත දැනුම් දෙන තුරු ආදායම් පරීක්ෂක වරුන් බඳවා ගැනීම අත්හිටුවා ඇත. එබැවින් මෙම ආදායම් පරීක්ෂක පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. | |
| (ii) | සභාව සඳහා එක් නීති නිලධාරියකු අනුමත කර ඇතත් සත්‍ය වශයෙන් නීති නිලධාරීන් 02 දෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ අධිකරණයේ පෙනී සිටීමට අදාළව නීති වියදම් ලෙස රු.856,000 ක් බාහිර පාර්ශවයන් වෙත ගෙවා තිබුණි. එමෙන්ම සංවර්ධන නිලධාරීන් 11 දෙනෙකු අනුමත කළද සත්‍ය වශයෙන් 19 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. ඒ අනුව සංවර්ධන නිලධාරීන් 8 දෙනෙකු අතිරික්තව සිටිති. | සභාවේ එක් නීති නිලධාරියකු සේවයේ යෙදී සිටියදී ප්‍රධාන ලේකම්ගේ CSWP/PTR/F1/11 හා 2022.01.21 දිනැති ලිපිය මඟින් තවත් නීති නිලධාරියෙකු ස්ථාන මාරුකර එවා ඇත. මේ සම්බන්ධයෙන් නාගරික කොමසාරිස්ගේ අංක KMC/02/01/02/45 හා 2022.02.21 දිනැති ලිපිය මඟින් පළාත් පාලන ලේකම් දැනුවත් කර ඇත.<br><br>එමෙන්ම අනුමත කාර්ය මණ්ඩලයට අනුව සංවර්ධන නිලධාරී 11 දෙනෙකු සේවයේ යෙදී සිටියදී තවත් සංවර්ධන නිලධාරී 8 දෙනෙකු සභාව වෙත අනුයුක්ත කර ඇත. පළාත් පාලන කොමසාරිසේග් LGD/2/උපාධි අභ්‍යාසලාභී හා 2021.10.15 දිනැති ලිපිය අනුව නව සංවර්ධන නිලධාරී තනතුරු 18 ක් ඇති කර ගැනීම සඳහා සාධාරණීයකරණ වාර්තාව හා මූ.රෙ 71 ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කර පළාත් පාලන ලේකම් (බ.ප) වෙත යොමු කර ඇත. | සභාවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව සේවකයින් සේවයට අනුයුක්ත කළ යුතුවේ . |
| (iii) | සභාව සඳහා විධිමත් ආකාරයට අනුමත නොකරන ලද ක්ෂේත්‍ර කම්කරු හා සෞඛ්‍ය කම්කරු ලෙස සේවකයින් 63ක් බඳවා ගෙන තිබුණ අතර මෙම බඳවා ගැනීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කාර්ය මණ්ඩලය තුළට අන්තර්ග්‍රහණය කරවා ගෙන නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2019 පරිදි 25/2014 හා 25/2014 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්හි සඳහන් සුදුසුකම් පිළිබඳ විධිමත් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල අනුව මෙම බඳවා ගැනීම සිදුකර ඇත. | බඳවා ගැනීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කිරීමට කටයුතු කළ යුතුවේ . |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවක ණය<br>---------------<br>2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ ශේෂවල එකතුව රු.87,963,943 ක් වූ අතර ඒ තුල ස්ථාන මාරු වී ගිය අවුරුදු 1-3 අතර අයවිය යුතු ණය ශේෂය රු.853,963ක් හා අවුරුදු 3 ට වැඩි සේවක ණය ශේෂය රු.32,955 ක්ද වශයෙන් එකතුව රු. 886,918ක ශේෂ පැවතුණි. තවද අවුරුදු 3ට වැඩි විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.358,922 ක් වූ අතර සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු අවුරුදු 3 ට වැඩි ණය ශේෂය රු.983,200ක් විය. ඒ අනුව එකතුව රු1,342,122ක් 2022 අප්‍රේල් විගණන දින දක්වා අයකර ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කර ගැනීම පිළිබඳව නීති නිලධාරී වෙත නීතිමය උපදෙස් ලබා ගැනීමට ලිපි යැවීම් කර තිබේ.ඒ අනුව ඉදිරියේදී පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයවිය යුතු සේවක ණය ශේෂයන් සභාවට පාඩුවක් නොවන ලෙස අය කිරීමට කටයුතු කළ යුතුවේ . |